# ‘මේඩ් ඉන් ශ්‍රී ලංකා’ සන්නාම ලාංඡනය - තෝරාගැනීමේ පිළිවෙත

## ✓ අවශ්‍යතා / සුදුසුකම් නිර්ණායක

1. අයදුම්කරු ව්‍යවසායකයෙකු හෝ කර්මාන්තකරුවෙකු විය යුතුය.
2. අයදුම්කරු ව්‍යාපාරයේ හිමිකරු/ප්‍රධාන හවුල්කරු හෝ කොටස් හිමිකරු විය යුතුය.
3. ව්‍යාපාරික ආයතනය අදාළ අධිකාරියක ලියාපදිංචි වී තිබිය යුතුය (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සමාගම් රෙජිස්ට්‍රාර් ...) සහ නිෂ්පාදනය ආශ්‍රිත සහතික අවශ්‍යතා (වෙළඳ සහතික, පාරිසරික සහතික ආදිය) සපුරා තිබිය යුතුය.
4. ව්‍යාපාරික ආයතනයට වසර 02කට වැඩි මෙහෙයුම් ඉතිහාසයක් තිබිය යුතුය.

## ✓ කොන්දේසි

1. නිෂ්පාදනයේ හෝ ක්‍රියාවලියේ සංයුතිය පහත පරිදි විය යුතුය:
   a. <u>නිෂ්පාදිතය දේශීය අමුද්‍රව්‍ය භාවිතයෙන් සිදු කරන්නේ නම්</u>
      දේශීය අගය එකතු කිරීම 60% හෝ ඊට වැඩි විය යුතුය.

   b. <u>නිෂ්පාදිතය ආනයනය කරන ලද අමුද්‍රව්‍ය භාවිතයෙන් සිදු කරන්නේ නම්</u>
      i. සැලකිය යුතු නිර්මාණ අගයක් නොමැති නම්, දේශීය අගය එකතු කිරීම 60% හෝ ඊට වැඩි විය යුතුය.
      ii. සැලකිය යුතු නිර්මාණ අගයක් තිබේ නම්, දේශීය අගය එකතු කිරීම 30% ප්‍රමාණවත් වේ.

2. ‘මේඩ් ඉන් ශ්‍රී ලංකා’ ලාංඡනය සඳහා අයදුම් කිරීමට නිෂ්පාදන වර්ගය අනුව සහතික අවශ්‍ය විය හැක.
   උදා: GMP/SLS/ISO සහතික - ආහාර ආශ්‍රිත නිෂ්පාදන සඳහා

3. ලාංඡනය පිරිනමනු ලබන්නේ නිශ්චිත නිෂ්පාදනයක් සඳහා මිස ව්‍යාපාරය සඳහා නොවේ.
4. ලාංඡනය ප්‍රදානය කරන ලද නිෂ්පාදන/ය සඳහා පමණක් භාවිත කිරීමට අවසර ඇත. එය වෙනත් නිෂ්පාදන සඳහා නීතිවිරෝධී ලෙස භාවිතා කරන බව අනාවරණය වුවහොත්, සමස්තයක් ලෙස ආයතනය සඳහා ම ලාංඡනය අවලංගු කරනු ලැබේ.
5. සැබෑ නිෂ්පාදකයා පැහැදිලිව සඳහන් කර නොමැති අවස්ථාවක දී ලාංඡනය භාවිතා කිරීමට අවසර නැත.
6. අයදුම්කරු ඔහුගේ/ඇයගේ සම්පූර්ණ ව්‍යාපාර ක්‍රියාවලිය සහ ලියකියවිලි පරීක්ෂා කිරීමට සහ තොරතුරු වල නිරවද්‍යතාවය සහතික කිරීමට අයදුම්පත් ඇගයීම් අදියරේදී NEDA වෙත සහය ලබා දිය යුතුය.
7. ‘මේඩ් ඉන් ශ්‍රී ලංකා’ ලාංඡනය මගින් සමස්තයක් ලෙස රට නියෝජනය කරන බැවින්, නිෂ්පාදනයේ/සේවාවේ අඛණ්ඩතාව සහ පිළිගත් තත්ත්ව අවශ්‍යතා සහ ප්‍රමිතීන් ආරක්ෂා කිරීම

සම්මානලාභීන්ගේ පරම වගකීම වනු ඇත. එය දේශීය අනන්‍යතාවය තහවුරු කිරීමක් බැවින්, 'මේඩ් ඉන් ශ්‍රී ලංකා' සංකල්පයට හානියක් සිදු නොවන බවට සැමවිටම සහතික විය යුතුය.

8. NEDA මගින් පත් කරන ලද රාජ්‍ය, පෞද්ගලික සහ වෘත්තීය ආයතනවල විශේෂඥයන්ගෙන් සමන්විත කමිටුවක් විසින් අවසාන තේරීම සහ අනුමැතිය සිදු කරනු ලබන අතර, කමිටුව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වනු ඇත.
9. තේරීමේ ක්‍රියාපටිපාටිය මත සිදුකරන්නාවූ ඕනෑම ආකාරයක බලපෑමක්, අයදුම්පත්‍රය වහාම අහෝසිකිරීමට හේතු වනු ඇත.
10. සපයා ඇති තොරතුරු අසත්‍ය බව අනාවරණය වුවහොත්, ලාංඡනය වහාම අවලංගු කරනු ලැබේ.
11. ලාංඡනයේ වර්ණ කිසිදු ආකාරයකින් වෙනස් කල නොහැක.
12. සමානුපාතික විශාලනය කිරීම හැර ලාංඡනයේ හැඩය/ස්වභාවය කිසිදු වෙනසක් සිදු නොකර භාවිතා කළ යුතුය.
13. අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමකදී නැවත සලකා බැලීම සඳහා උපකාරක සාක්ෂි සහිතව දින 30 ක කාලයක් තුළ අභියාචනා කිරීමට අයදුම්කරුට අයිතිය ඇත.

### ✓ NEDA වගකීම්

1. අයදුම්පත් පරීක්ෂා කිරීම අයදුම්පත් ලැබෙන පිළිවෙල අනුව සිදු කරනු ලැබේ.
2. අවශ්‍ය විටෙකදී ඕනෑම අමතර ලියකියවිලි/සාක්ෂි ඉල්ලා සිටීමේ අයිතිය NEDA සතුය.
3. තෝරාගත් සම්මානලාභීන්ගේ නම් සහ ප්‍රතික්ෂේප කිරීම් ලිඛිතව දැනුම් දෙනු ලැබේ. ඊට අමතරව, සම්මානලාභීන්ගේ නම් පොදු වෙබ් අඩවි වල ප්‍රකාශයට පත් කෙරේ.